## 79 – මා පියුමක් ලෙස

මා පියුමක් ලෙස ඔබ පාමුල පරව ගියාවේ
දූවිල්ලක් ලෙස ඔබ පායුග මත රැඳුනාවේ
මී බිඳුවක් ලෙස ඔබ දෙතොලට රසය වූනාවේ
තෙල් බිඳුවක් ලෙස ඔබ කෙස් මත මා ඇලූනාවේ

ඝන අඳුරට සඳ පහනය සමිඳුනි ඔබ අපටා
ඔබ වත මට දෙයි සහනය සැම සතුරන් පලවා
මගෙ සිරුරේ දිවයන රුහිරෙට ජීවය පොවනා
දුක් සුසුමක් ඔබ ඇති තැන මට සතුටක් දෙවනා

මඳ පවනක් ලෙස මා ගත වැද සිසිල ගෙනාවේ
ඔබ සීතල රැයකට මාහට උදුන වූනාවේ
ජේසුනි ඔබෙ නම මතුරා ගී කියමි නිරතුරා
රඳවා සෙනෙහස උතුරා ඔබමය මා මිතුරා